





කොළඹ දිස්ත්‍රික්කයේ, වයස අවුරුදු 36, උස අඩි 5 අඟල් 2, රූමත් උගත්, ඉතා චරිතවත්, බීඑස්සී උපාධිධාරී ඖෂධවේදී සොයුරියට, උගත්, චරිතවත්, සහකරුවකු, මෙලබර්න් හි පදිංචි සොයුරිය සොයයි.
දුරකතන 0421780374
email - justula@hotmail.com

NSMP 176

Buddhist govi mother seeks a partner for her daughter, working in Sri Lankan Airline, as an Assist. Accountant, 25 yrs, 5'2" , well mannered, pretty and religious. Willing to settle down in Australia. For more info aunty in Queensland Tel 0747281531

NSMP 173

සිංහල බොදු උස අඩි 5 ක් වූ, සුදු, රූමත්, කොළඹ ජාත්‍යන්තර පාසලක ගුරුවරියක් ලෙස සේවය කරන, ළඟදී දික්කසාද වූ, වයස අවුරුදු 55 ක් වූ, ඉතා අඩු වයස් පෙනුමැති, සොහොයුරියට දැනට ඕසට්‍රේලියාවේ සිටින සොහොයුරිය, ස්ථිර ආදායමක් ඇති, යහපත් ගුණගරුක, ඕස්ට්‍රේලියාවේ පදිංචි ස්වාමිපුරුෂයකු සොයයි. බේද නොමැත. විස්තරය 1243.xyz@gmail.com මගින් දන්වන්න.

NSMP 172

parents seek suitable partner for their pretty fair 27 years old daughter who works as an engineer in melbourne need all details with horascope email to jasmin.anoma@yahoo.com.au

NSMP 170

## සන්නස මංගල යෝජනා ප්‍රතිඵලදායකයි

G/B parents seek a well educated son for their daughter 29yrs, 5'4", Slim and Fair. Residing in Melbourne and working in a leading hospital as a Research Officer. Please email details and horoscope to s.r.leelaratne.2009@gmail.com

NSMP 174

බොදු ගොවි වයස 25 ක් වන ලංකාවේ රජයේ ගුරුවරියක් ලෙස සේවය කරන පවුලේ එකම සොහොයුරියට ස්ථිර රැකියාවක් ඇති ලංකාවේ හෝ ඕස්ට්‍රේලියාවේ පදිංචි වයස 30 කට නොවැඩි සුදුසු සහකරුවෙකු ඕස්ට්‍රේලියාවේ ස්ථිර පදිංචිය ඇති සොහොයුරා සොයයි. විස්තර prasadxp1980@gmail.com ඊමේල් ලිපිනයට එවන්න.

NSMP 171




ම/පළාත බොදු ගොවි 29, අඩි 5 අඟල් 9. ඉතා කඩවසම් සුරා සූදුවෙන් තොර ජපානයේ උසස් අධ්‍යාපනය ලබා දැනට එහි සේවය කරන දේපළ හිමි ව්‍යාපාරික පවුලක බාල සොහොයුරාට ඕස්ට්‍රේලියාවෙන් සහකාරියක් සොයනුයේ මෙහි පදිංචි සොහොයුරියයි. පිළිතුරු sannasaprop@hotmail.com

NSMP 175

මෙල්බන්හි ස්ථිර පදිංචිය හිමි මෑතකදී ලංකාවෙන් පැමිණි සිංහල බොදු 34 උස 5 5 තඩවසම් පුතුට රූමත් චරිතවත් වයස 27 ට අඩු සහකාරියක් මව්පියෝ සොයති. ඕස්ට්‍රේලියාවේ ඉගෙනුම අවසන් කළ ශිෂ්‍යාවක් වුවද කම් නැත.
ඊමේල් chanlanka1976@gmail.com

NSMP 169

# SANNASA CLASSIFIEDS

## Business for Sale

Sri Lankan, Indian & Asians Grocery and food shop for sale in S/E Suburbs

" **Good Location**
" **Wide Customer Base**
" **Fully Equipped Kitchen + Food Permit**
" **Cheep Rent**
" **Popular Name Business in 12 years**

Genuine Enquiries Only Please
Please Contact 0407119138

## New House for Sale

Newly built 2 storied, a bed house on a 18 perch land in Gonawala, Kelaniya. 90% complete, immediate sale, Rs 9.5 million. Beautiful river front. ideal for luxury living or for a tourist motel.

**Tel (03) 9763 7206 or 0431 547**

36 වන පිටෙන්

වුණෙමු.
පාස්කු ඉරු දින, උත්ථානය වූ ජේසුස් ක්‍රිස්තූස් වහන්සේ අපට ගෙනා ප්‍රීතිය මෙන්ම සිංහල දමිළ අළුත් අවුරුද්ද ශ්‍රී ලාංකික අප වෙත ගෙනෙන නැවුම් පහන් සිතුවිලි සමරමින්ද ශ්‍රී ලාංකික චරිතානු කූලව ගත කෙරිණ. පාස්කු ඉරුදින උදෑසනම අපි, කිරිබත් සහ කැවුම් කොකිස් ඇතුළු ශ්‍රී ලාංකික රසකැවිලි වලින් පිරි උදෑසන ආහාර වේලක රස වින්දෙමු. අති උතුම් වැලෙන්සි මෙන්ඩිස් රදගුරු හිමිපාණන් යාඥාවකින් දවස දෙවි පියානන් වහන්සේට ඔප්පු කරමින් අවුරුදු උත්සව කටයුතු ආරම්භ කළහ. එදින වැයෙනු රබන් සුරල් පද, අප සියළු දෙනම මොහොතකට, මව් බිම කරා ගෙන ගියා වැනි විය. එදින පැවැත්වුණු අවුරුදු උත්සවයට බාල මහලු වයස් භේදයකින් තොරව සියල්ලෝම සහභාගී වූහ. මෙම විනෝදය පිරි උත්සවයට ක්‍රීඩා තරඟ බොහොමයක් ඇතුල් වූ අතර ඉන් සමහරක් නම් බැලුන් පිපිරීම, කණාමුට්ටි බිඳීම , අලියට ඇහැ තැබීම, බිත්තර ඇල්ලීම, පිටි තුළ කාසිය සෙවීම, මීටර 100 දිවීම, හොඳම සිනාව, වොලිබෝල් සහ එල්ලේ තරඟ විය. කාගෙත් සිත් ගත් අංගයක් වූයේ අවුරුදු 12 න් පහළ දරුවන් ඉදිරිපත් කළ විකට ඇඳුම් ප්‍රදර්ශනය , වූ අතර එහි ලාබාලම නිරූපිකාව වූයේ සය මසක් වයස් වූ රෙද්ද හැට්ටයකින් හැඩ වූ දැරිවියකි. අති උතුම් වැලෙන්සි මෙන්ඩිස් රද ගරු හිමිපාණන් විසින් සියලුම තරඟ ජයග්‍රහහයකයින්ට තෑගි ප්‍රදානය කෙරුණු අතර සියලුම කුඩා දරුවන්ට තැගි පාර්සලයක් සහ උත්ථාන වූ ජේසුස් ක්‍රිස්තූන් වහන්සේගේ අපට ගෙනා නව ජීවනය සිහි ගන්වමින් - ඊඑැර ඥටටි, බෙදා දෙන ලදී. මෙසේ කතෝලික අපට පාස්කු මංගල්‍ය තුලින් සහෝදරත්වය සහ ජාතික සාමූහිකත්වය දායාද කර ඇති බව නොරහසකි. එයට එක්රොක්ව ලැබුවා වූ පාස්කුව හා අලුත් අවුරුද්ද සැමරූ අප සාමයේ මිහිර බෙදාගෙන, සාමූහිකත්වයෙන් ඉදිරියටත් කටයුතු කිරීමට අදිටන් කර ගත්තා පමණක් නොව ලැබුවා වූ පාස්කුවේත්, අලුත් අවුරුද්දේත්, අසිරිය වැඩි කල බවට එක් වූ සියල්ලන්ම සාක්ෂි දරණු ඇත.

මෙසේ පාස්කුව සහ සිංහල සහ දමිළ අළුත් අවුරුද්ද අප කරා සමාන පණිවිඩයක් ගෙනෙන බව නොරහසකි. එනම් එකමුතුකම සහ පසුගිය අමනාපකම් අමතක කිරීම මෙන්ම වැඩිහිටියන්ට ගරු කිරීම සහ එකිනෙකා අතර ඇති සම්බන්ධකම් අලුත් කිරීම ගැනීම තුළින් අළුත් හෙටක් වෙනුවෙන් ඇප කැපවිය යුතු බව මතක් කරන කාලයයි. පාස්කු මංගල්‍යය තුල උත්ථානය වූ ජේසුස් ක්‍රිස්තූන් වහන්සේ තුලින් නව ජීවනයක් ලබන අප, සාමය රජ කරන යුගයටකට පා තබන අතර එම පණිවිඩයම ශ්‍රී ලාංකික අපගේ සිංහල හා දමිළ අළුත් අවුරුද්ද තුළද මතක් කර දෙයි. එනම් අළුත් ඇඳුමින් සැරසී, ආගම් ජාති භේදයකින් තොරව එකට එක්වී රසකැවිළි බෙදා හදාගෙන, එක මවකගේ දරුවන් මෙන් නෑගම් යමින්, මුළු රටම සතුට පිරි එකම ක්‍රීඩා පිටියක ස්වරූපයක් ගන්නා එම සිංහල හා දමිළ අළුත් අවුරුද්ද අපට මතක් කර දෙන්නේ ද පාස්කුව ගෙනෙන සාමයේ පණිවිඩයමයි.

ඕස්ට්‍රේලියා-ශ්‍රී ලංකා කතෝලික සංගමයේ සාමාජිකයන් වශයෙන්, අප සංගමය මගින් මෙම 2010 චතාරික සහ පාස්කු සමය සහ සිංහල සහ දමිළ අළුත් අවුරුදු සමය තුල මෙල්බර්න් වාසික කිතුනු ජනතාව වෙත දෙවියන් වෙත ලංවීමටත්, උන්වහන්සේගේ ආශිර්වාදය ලබා ගැනීමටත්, අපගේ ජාතික එකමුතුකම පිළිඹිබු කිරීමටත් ඉදිරිපත් කෙරුණු සියළු වැඩසටහන් ඉතා සාර්ථක ලෙස සංවිධානය කෙරුණු බව කීම අතිශයෝක්තියක් නොවේ. මේ අවස්ථාවේදී අප වෙත ලැබුණු ආශිර්වාද සඳහා දෙවියන් වහන්සේට ස්තූති පුද කරන අතර ඉදිරියට අපට උදාවන්නා වූ සෑම වසරකදීම මෙවන් ආත්මික වටිනාකමකින් යුතු ක්‍රියාකාරකම් සංවිධානය කර ගැනීමටද ඒවාට සහභාගී වීමට දේව වරප්‍රසාද ලබා දෙන ලෙසට ද, අපි ඉල්ලා සිටිමු.

## අමා දහරින් සිත් නිවේවා

වෙසක් මාසය සියලු ලෝකවාසී බෞද්ධ ජනතාවට සුවිශේෂිවු කාලයක් වන අතර පොසොන් මාසය ශ්‍රී ලාංකික බෞද්ධ ජනතාවට අතිශය වැදගත්ය. මිහිදු හිමියන් ලක්බිම බුදු සසුන පිහිටුවීමෙන් උදා වු මෙහෙය නැවතත් අලුත් වෙමින් පවති . මවුබිමෙන් සැතපුම් දහස් ගණනක් දුර උවත් මෙල්බන් නගරයේ වෙසෙන බෞද්ධ ජනතාවට ඒ දහම නොඅඩුව ලැබීම කියා නිමකල නොහැකි සතුටකි. විහාරස්ථාන හයක් සහ මෙහෙණින් වහන්සේ නමකගේ ආරණ්‍යයක් මගින් ඉටු වන කටයුතු අපමණය ඒ කටයුතු වලට ආලෝකයක් බදු අති පූජ්‍ය කිරිබත්ගොඩ ඥානානන්ද ස්වාමීන් වහන්සේගේ මහමෙවුනා අසපුවක් ද මෙම මස සිට ආරම්භවේ. ඉංග්‍රීසි බස මුල්කරගෙන අධ්‍යාපනය ලබන අප දරුවන් බුදු දහමින් ඈත් නොවී තබා ගැනීමට අප ඔවුනට ආදර්ශවත් වී මේ කාලය තුල වත් ආගමික කටයුතුවල යෙදීම සාරධර්ම සපිරි අනාගත පරපුරක් දැක ගැනීමට ඉවහල්වේ.

සියලු සමාජ කටයුතු මැනවින් ඉටුකරන ප්‍රමුඛ සාමාජික ආයතනයක් වන ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය ද වෙසක් හා පොසොන් සිහිකරමින් මිය ගිය සාමාජික මහතුන් හා පවුල්වල අය ද යුද්ධයෙන් අහිමි වු විරුවන් සමරමින් ශීල භාවනා වැඩ සටහනක් සංවිධානය කර ඇත.

මෙය මෙල්බන් මහවෙවුනා භාවනා අසපුවේ ප්‍රධානත්වයෙන් සිදුකරන අතර එහි වැඩ වාසය කරන අතිපූජ්‍ය ගින්තොට විමල ස්වාමින් වහන්සේ වැඩ සටහන මෙහෙයවති . ධර්ම දේශනා ධර්ම සාකච්ඡා භාවනා වැඩසටහන් වලින් සමන්විත මෙම පුණ්‍ය කටයුත්ත සඳහා කීස්බරෝ ධර්ම සරණ විහාරාධිපති පූජ්‍යපාද නාඔටුන්නේ විජිත ස්වාමින් වහන්සේද රොක්බැන්ක් පාරමිතා බෞද්ධ විහාරාධිපති පූජ්‍යපාද පල්ලෙවෙල දේවරක්ඛිත ස්වාමින් වහන්සේද වඩින්නෝය.

උදෑසන 8.30 ට ආරම්භ වන මෙම වැඩසටහන සවස 5.00 අවසන් වන අතර මෙය පැවැත්වෙනුයේ Mulgrave Nerghborhood House (Wellington Reserve Community Centre) 36 Macki Doad Mulgrave 3170 (Melway Ref 80B2)

පැවැත්වෙන දිනය ජුනි මස 13 දා ඉරිදාය.

මෙම උතුම් ධර්ම දානමය පින්කමට සහභාගි වන සැමට දහවල් දානය සහ ගිලන්පස සංගමය මගින් සැපයේ. සැමට ගෞරවයෙන් ආරාධනා කරමු. ජුනි මස 14 වන දින එනම් පසුදින ලේ දන්දීමේ ව්‍යාපාරයක් ද සංවිධානය කර ඇත. එය පැවැත්වෙන්නේ මවුන් වේවලි රතුකුරුස මධ්‍යස්ථානයේදීය. වැඩි විස්තර සඳහා ශාන්ත නානායක්කාර 0401714189 සරත් වික්‍රමසිංහ 0425767157 බන්දු මේලතන්ත්‍රි 0402457884 විමසිය හැකි ය.

ලක් හඬ FM 97
සෑම ඉරිදාවකම
දහවල් 10.00 සිට 12.00 දක්වා
ඔබේ හඬ - ලක් හඬ

රංජිත් රූබි සමග පැය තුනක් විනෝදය සහ නැවුම් ගීත සමගින් සෑම ඉරිදාවකම රාත්‍රී 8 ට හමුවෙමු
Voice of Lanka
97.7FM 3SER

ලක් මිහිර
සිංහල ගුවන් විදුලිය
සෑම බ්‍රහස්පතින්දාම සවස 6 සිට 8 දක්වා
FM 88.6

FM 94.1
ලක් මිහිර South
අඟහරුවාදා රාත්‍රී
10 - 12 දක්වා
අසන්න - විඳින්න